

<u>අපි දැන් බලමු **Microsoft Teams App** එක තමන්ගේ **PC/Lap top** එකට කොහොමද **Install** කර ගෙන **Configure** කර ගන්නේ කියලා.</u>


ඔබගේ PC එකට Microsoft Teams App එක Install කර ගැනීම සඳහා මුලින්ම ඔබගේ Computer එකේ Web Browser එක Open කර ගන්න. එහි Search ස්ථානයේ Download Microsoft Team ලෙස type කර search කරන්න. අනතුරුව ඔබට ලැබෙන Searching Result වල පළමුවෙන් ඇති Link එක මත Click කරන්න.





අනතුරුව ඔබට පහත දැක්වෙන Window එක දැකිය හැකිය. එහි ඇති Download for Desktop මත Click කරන්න.





අනතුරුව ඔබට පහත දැක්වෙන Window එක දැකිය හැකි අතර එහි ඇති Download මත Click කරන්න.





අනතුරුව ඔබට Microsoft Team .exe file එක Download වන ආකාරය දැකිය හැකිය.




Download වුන ඔබට Microsoft Team exe file එක Save වූ ස්ථානයට ගොස් ඒ මත Double click කරන්න. එවිට Microsoft Teams App එක Install වී පහත දැක්වෙන Window එක Open වනු ඇත. එහි Sign in යන ස්ථානයට ඔබට JMC ආයතනයෙන් ලැබුන Email Address එක type කර Sign in මත Click කරන්න.




අනතුරුව ඔබගෙන් Password එක විමසන අතර ඒ සඳහා ඔබට JMC ආයතනයෙන් ලැබුන Password එක type කර Sign in මත Click කරන්න.




ඉන් අනතුරුව ලැබෙන Window එකේදී ඔබට JMC ආයතනයෙන් ලැබුන Default Password එක වෙනස් කිරීමට අවස්ථාවක් ලැබේ. එහිදී ඔබට Current Password, New Password සහ Confirm Password යන ස්ථාන සඳහා තොරතුරු ලබා දීමට සිදුවන අතර එම ස්ථානයන් වල ලබා දෙන Password තොරතුරු හොඳින් මතක තබා ගැනීමට සිදු වනු ඇත.




ඉන් අනතුරුව ඔබගේ Teams Account එකේ ආරක්ෂාකාරීව පවත්වා ගැනීමට අවශ්‍ය තවත් Security Information ලබා දීමට සිදුවනු බව දන්වමින් තොරතුරු ඇතුලත් පණිවිඩයක් දැකිය හැකිය.

එය කියවා අනතුරුව Next මත Click කරන්න.



අනතුරුව ඔබට don't lose access to your account යන Window එක දැකිය හැකි අතර එහිදී ඔබගේ Account එකේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ආකාර 2කින් තොරතුරු විමසනු ඇත.


එනම් “Authentication Phone is not configured” සහ “Authentication Email Address is not configured” වශයෙනි.

අවම වශයෙන් මෙම Option 2කින් එකක්වත් ඔබ සම්පූර්ණ කිරීම කළ යුතුය. මෙම security option දෙකෙන් එකක් හෝ Setup නොකර Teams Account එකට Login වීමට ඔබට හැකියාවක් නොලැබෙනු නැත. මෙය අනිවාර්ය අංගයකි.

මෙම අදියරේදී ක්ෂණිකව පරීක්ෂා කල හැකි පෞද්ගලික Email Address එකක් හෝ ජංගම දුරකතන අංකයක් ඔබට තිබිය යුතුය.


එසේම මෙම ක්‍රියාවලිය සඳහා ඔබට ලැබෙනුයේ විනාඩි 15ක් වැනි කෙටි කාලයකි. මෙම කාලය තුල Authentication කටයුතු අවසන් කල යුතුය.

එම නිසා දැන් Authentication Email Address is not configured ඉදිරියෙන් ඇති Set it up Now යන Link එක මත Click කර Email Authentication Option එක තෝරා ගෙන ඉදිරියට යා හැකිය.




අනතුරුව ඔබගෙන් Authentication Email address එකක් විමසනු ඇත. එම ස්ථානයේ තමන්ගේ පෞද්ගලික Email address එකක් type කිරීමට හැකියාව ලැබෙනු ඇත. අනතුරුව email me යන button එක මත Click කල යුතුය: :you will receive the help from branch staff).


Authentication ක්‍රියාවලිය සඳහා විනාඩි 15ක කාලයක් ලැබෙන අතර එම කාලය ඉක්මවා ගියහොත් ඔබගේ Validation code verify කිරීමේ ක්‍රියාවලිය expire වනු ඇත. එවිට ඔබට නැවත Validation Code එකක් request කිරීමට සිදුවනු ඇත. එම නිසා ඔබ මෙම ක්‍රියාවලිය විනාඩි 15ක් ඇතුලත අවසන් කිරීමට සැළසුම් කර ගත යුතුය.






email me මත Click කිරීමෙන් අනතුරුව ඔබ ලබාදුන් Email Address එකට validation code එක අඩංගු Email message එකක් ලැබෙනු ඇත.

එම email එක පරීක්ෂා කිරීමේදී Your code is ලෙස සඳහන්ව අංක 6 ක code එකක් ඔබට දැකිය හැකිය.

එම code එක Microsoft Teams configuration screen එකේ verification code යන ස්ථානයේ type කර verify යන button එක මත Click කළ යුතුය.








අනතුරුව Don’t lose access to your account යන screen එකට නැවත පැමිණෙන අතර එහිදී Authentication Email Address is set to (පෞද්ගලික Email address එක) ලෙස වෙනස් වී ඇති ආකාරය ඔබට දැකිය හැකිය.

අනතුරුව Finish මත Click කල යුතුය. එවිට මෙම Account setup කිරීමේ ක්‍රියාවලිය අවසන් වේ.




අනතුරුව Close මත Click කරන්න.




ඔබගේ Microsoft Teams Account එකට setup කර අවසන් වූ පසු එම Account එකට Automatically Login වනු ඇත. නිසි ආකාරයෙන් ඔබ Microsoft Teams Account එක setup කර ඇත්නම් මෙවැනි Interface එකක් ඔබට දැක ගැනීමට හැකි වනු ඇත.

අනතුරුව මෙම Interface එක භාවිතයෙන් ඔබටගේ Teams class එකට අදාල සියළු කටයුතු කළමණාකරණය කල හැකි අතර ඔබගේ Online දේශන සඳහාද සහභාගී වීමට හැකියාව ලැබෙනු ඇත.

